**ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 08 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වන 2019 මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කල යුතු වුවත්, දින 45ක ප්‍රමාදයකින් පසුව 2019 මැයි 15 දි ඉදිරිපත් කර තිබුණි. | නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වීම. | ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. |

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අනුගමනය කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. | ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ යන්ත්‍රෝපකරණ හා වාහනවල එකතුව 41 ක් වුවද, ඒ සෑම ඒකකයකම වටිනාකම තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙනැවිත් නොතිබූ අතර ඒවායේ මුළු එකතුව රු.12,534,720 ක් පමණක් හෙලිදරව් කර තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ආ යුතු වීම. | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි ලැයිස්තුගත කර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වටිනාකම් තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙනැවිත් නොතිබුණි. | නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ආ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | පාඨකයින් විසින් ආපසු භාර දී නොතිබුණු රු.102,270 ක් වටිනා පොත් 800 ක වටිනාකම තක්සේරු කර අවසන් පොත් තොගයක් අඩුනොකර වත්කම් වශයෙන් ඉදිරිපත් කර තිබුණි. | පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළයුතු වීම. | අය කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,521,950 ක් අවසන් ගිණුම් වලට හෙලිදරව් කර නොතිබුණි. | නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වල හෙලිදරව් කළයුතු වීම. | පිළිගෙන ඇත. ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඉ) | ලැබිය යුතු උසාවි දඩ ගාස්තු රු.174,125 ක් අවසන් ගිණුම්වලට හෙලිදරව් කර නොතිබුණි. | නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට හෙලිදරව් කළ යුතු වේ. | පිළිගෙන ඇත. ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඊ) | UNOPS ආයතනයෙන් 2017 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබූ අංක AE 8132 දරන මොන්ටේරෝ රථයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙනැවිත් නොතිබුණි. මේ නිසා ශුද්ධ වත්කම් මෙම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ආ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේදි කටයුතු කරනු ලැබේ. |
| (උ) | රු.මිලියන 276 ක් වටිනා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2017 අප්‍රේල් UNOPS ආයතනය විසින් සභායට භාර දී තිබූ නමුත් මෙම වත්කම් | වත්කම් වල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ආ යුතු වීම. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඍ) | JICA වැඩසටහන මගින් රු.මිලියන 40ක් වටිනා ග්‍රාමීය ජල සම්පාදන සැලැස්ම අංග සම්පූර්ණ කර 2015 මැයි මාසයේ සභාවට පවරා දී තිබුණත් මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වත්කම් වල නිවැරදි වටිනාකම අවසන් ගිණුම්වලට ගෙන ආ යුතු වීම. | ඉදිරියෙදි ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

| | නීතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීතී මාලාව | | | |
| (i) | III පරිච්ඡේදයේ 59 වගන්තිය | ඉඩම් පැවරීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ආපසු ලබා ගැනීම් ඉල්ලීම් කිරීමේ අයදුම් පත්‍ර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාටත්, අනෙකුත් ගනුදෙනු සම්බන්ධ ගාස්තු ආපසු ලබාගැනීමේ ඉල්ලීම් අයදුම්පත්‍ර, රජයේ භාණ්ඩාගාර අධ්‍යක්ෂකවරයාටත්, දඩ ගාස්තු ආපසු ලබා ගැනීම් ඉල්ලීම් අයදුම්පත්‍ර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාටත් සෑම කාර්තුවක් අවසනායේදීම ඉදිරිපත් කර නොතිබුණි. | මේ අනුව ක්‍රියා කලයුතු වීම. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ . |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | III වන පරිච්ඡේදයේ 81 වගන්තිය | වෙලඳ බදු පිලිබඳ සෑම වර්ෂයක් ආරම්භයේදීම සහා බල ප්‍රාදේශයේ ගණනය කිරීම් ක්‍රියාත්මක කර ඒ අනුව වෙලඳ බදු පිලිබද ලැයිස්තුවක් පිලියෙල කර නොතිබුණි. | බදු පිලිබඳ ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්මවා තිබු කල් ඉකුත් වු රු.641,548 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආපසු ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරුකිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතු වීම. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.33,302,965 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.20,284,742 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,018,223 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ විගණනයේදී 1993 වර්ෂයේ සිට රු.9,968,140 ක් අයකර නොගෙන හිඟ හිටව පැවතුනි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ ආරම්භයේදී අයකරගත යුතු හිඟ ආදායම් රු.7,039,879 ක් වුවත්, එය වර්ෂ අවසානයේදී තවදුරටත් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගත යුතුය. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු රු.85,000 ක් පමණක් අයකර ගෙන තිබුණි. පසුගිය වර්ෂයේ හිඟහිටව පැවති රු.992,081 ක් මෙම වර්ෂයේදීද එලෙසම පැවැතුණි. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4 කඩ කුලී**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී කඩ කුලී ආදායම් රු.10,142,300 ක් පමණක් අයකර ගෙන තිබූ අතර හිඟහිටව පැවති වටිනාකම රු.3,047,521 ක් ව පැවැතුණි. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.5 වෙළඳ බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු.2,786,516 ක් අයකර ගෙන තිබූ අතර හිඟහිටි කිසිවක් දක්වා නොතිබුණි. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.6 අනෙකුත් ආදායම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනෙකුත් ආදායම් ලෙස රු.77,173,140 ක් ලැබී තිබුණත්, හිඟහිටි ලෙස රු.5,928,536 ක් දක්වා තිබුණි. | හිඟ හිටි ආදායම් විධිමත්ව අයකර ගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.7 උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.174,125 ක උසාවි දඩ ගාස්තු සහ රු.5,521,950 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව පැවතුණි. | ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. | ලබාගැනීමට කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන 07 විසින් එකතු කරනු ලබන දිරන ලද නොදිරන අපද්‍රව්‍ය එක්රැස් කර කළමනාකරණය කිරීම සඳහා කොඩුවාමඩු යන ස්ථානයේ ආසන්න වශයෙන් රු.මිලියන 400 ක වියදමින් අක්කර 50 ක භූමි භාගයක 2017 අප්‍රේල් මාසයේදී UNOPS ආයතනය විසින් මෙම මධ්‍යස්ථානය ඉදිකර ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ අනුව පළාත් පාලන ආයතන 07 විසින් | සුදුසු ගාස්තු අයකළ යුතු වීම. | අනාගතයේදී සැලකිල්ලට ගනු ලැබේ. |

එකතු කරනු ලබන දිරන හා නොදිරන කසළ මෙම මධ්‍යස්ථානයේ එකතු කරනු ලබන බවත් එක් ටොන් එකක් සඳහා රු.630 ක් අයකිරීමටද එකඟ වී තිබුණි. මේ අනුව බොහෝමයක් සභාවන් කසල ගෙන ගොස් තිබූ නමුත් සභාව විසින් මෙම ගාස්තුව පියවරෙන් පියවර රු.1,800 ක් දක්වා වැඩි කිරීම නිසා පළාත් පාලන ආයතන විසින් යවනු ලබන සන අපද්‍රව්‍යයද ක්‍රමයෙන් අඩුවෙමින් පැවතුණි.

**(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ දර්ශකයන් ඇති කළ යුතු වීම. | අනාගතයේදී කටයුතු කරනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| | කරඩියනාරු පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය | | |
| (අ) | ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභ බල ප්‍රදේශයේ කර්ඩියනාරු යන ස්ථානයේ JICA ණය ආධාර වැඩසටහන මඟින් ග්‍රාමීය පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙමඟින් | පානීය ජලය ලබාදීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | සාමාන්‍යයෙන් පවුල් 400 කට පානීය ජලය බෙදාහැරීම සිදුකළ හැකිය. මේ සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් 03 ක් මඟින් (ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යය, විදුලිය සම්බන්ධතා ඉංජිනේරු කාර්යයන් සහ නළ එළිමේ කාර්යය) සාමාන්‍යයෙන් රු.මිලියන 40 ක වියදමින් ඉදිකර තිබුණි. තවද, ජ්ලැන් ලංකා ආයතනයෙන් රු.1,782,820 ක් ලබාගනිමින් නිවාසවලට ජලය ලබාදීම සඳහා වැයකොට 2015 මැයි මාසයේ සිට ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන නමුත් සභාවේ ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය මඟින් මේ දක්වා මහජනතාවට ජලය බෙදාහැර නොතිබුණි. | | |
| (ආ) | සභාවේ සමාලෝචිත වර්ෂයේ ජංගම ගිණුම පවත්වාගෙන යන මුදල් පොත අනුව රු.මිලියන 25 සිට රු.මිලියන 30 ක් දක්වා වන පරාසයකින් අතැති මුදල් ශේෂ පැවතුණි. එසේ වුවත්, මෙය ඵලදායී ලෙස ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු නොකිරීම නිසා සභාව විසින් ආසන්න වශයෙන් රු.මිලියන 02 ක ආදායමක් අහිමි කර තිබුණි. | සභාවේ මුදල් සුදුසු අයුරින් පරිපාලනය කිරීමට කටයුතු කළ යුතු වීම. | සුදුසු ආයෝජනයකට යෙදවීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය හා අදාළ මුදල් වෙන්කිරීම සඳහා එකඟතාවය ලබාගැනීමෙන් අනතුරුව පමණක් සේවකයන් අනියම් හා කොන්ත්‍රාත් | නිලධාරීන් බඳවා ගැනීමේදී අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සැලකිල්ලට ගත යුතුය. | ඉදිරියේදී අවධානය යොමු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | පදනමින් බඳවාගත යුතුය. ඒසේ වුවත්, මෙයට පටහැනිව පූර්ව අනුමැතිය සහ එකඟතාවය නොලබා 2015 වර්ෂයේදී සේවකයන් 116 දෙනෙකු අනියම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. මේ නිසා, දැනට සේවකයන් 16 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව පැවැතුණි. | | |
| (ආ) | වර්ෂ 05 කට පෙර සේවය හැර ගිය, විශ්‍රාම ගිය, සේවය අත්හිට වූ, ස්ථාන මාරු වී ගිය සේවකයන් 07 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.583,445 ක හිඟ ණය මුදල් අදාළ පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවැතුණි. | අයකිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අඛණ්ඩව ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

----------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සභාවට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ඒවා සලකුණු කර තැබීම සඳහා වන නියමිත ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය වන විටත් ගෙන නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ලේඛනගත කළ යුතු වීම. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**3.5.2 වාහන උපයෝජනය**

------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වාහන 22 ක් සඳහා ඉන්ධන පරිභෝජනය පිළිබඳ වාර්තාව වර්ෂයකට අධික කාලයක සිට යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් ඉන්ධන පරිභෝජනය පිළිබඳ වාර්තාව ලබාගත | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | |
|---|---|
| ලබාගෙන නොතිබුණි. වර්ෂ 07 කට අධික කාලයක සිට වාහන ලියාපදිංචි කිරීමේ පොත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පනතේ විධිවිධානවලට අනුව ලබාගෙන නොතිබුණි. | යුතු වීම. |

**3.6 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වීථි විදුලි පහන් සවිකිරීම සඳහා රු.1,290,095 ක් වැය කර තිබුණි. මෙහිදී ලැබීම් හා නිකුත් කිරීම් මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව ලේඛනවල විධිමත් අයුරින් සටහන් කර නොතිබුණි. අවශ්‍යතාවය සහ මහජනතාවගේ ඉල්ලීම් සැලකිල්ලට නොගෙන අවශ්‍යතාවයට වැඩියෙන් මිලදී ගෙන තිබුණි. | විධිමත් ආකාරයෙන් ලේඛනගත කළ යුතු වීම. | අනාගතයේදී විධිමත් අයුරින් කටයුතු කරනු ලැබේ. |

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර එයට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. | අනාගතයේදී පිළියෙල කරනු ලැබේ. |